SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## 2020 ජූලි විභාගය – අදියර III

## යෝජිත උත්තර
## (304)

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2020 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

## යෝජිත උත්තර

**(මුළු ලකුණු 20)** **A කොටස**

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 01 - ශ්‍රී ලංකාවේ බදුකරණය හැඳින්වීම**

| පැමිණි දිනය | බැහැර වූ දිනය | ශ්‍රී ලංකාවේ සිටි දින ගණන |
|---|---|---|
| 2018.05.01 | 2018.08.15 | 107 |
| 2018.11.15 | 2019.01.20 | 66 |
| 2019.03.05 | 2019.03.31 | 26 |
| එකතුව | | **199** |

ඉහත තොරතුරු වලට අනුව 2018 / 2019 තක්සේරු වර්ෂය තුළ ඔහු කායිකව ලංකාවේ දින 199 ක් වාසය කර ඇති අතර එමනිසා එම තක්සේරු වර්ෂයේ බදු අරමුණු සඳහා ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකි.

යම් පුද්ගලයකු යම් තක්සේරු වර්ෂයක් තුළ දී ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුළ දී දින එකසිය අසූතුන (183)ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම් එම පුද්ගලයා එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා වාසික පුද්ගලයකු සේ සැලකේ.

***(ලකුණු 05)***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

***පරිච්ඡේදය 07- අනෙකුත් ව්‍යාපාර බදු***

a)

1. සැපයුම්කරුගේ නම, ලිපිනය හා ලියාපදිංචි අංකය
2. සැපයුම ලැබූ තැනැත්තාගේ නම සහ ලිපිනය
3. බදු ඉන්වොයිසි පත්‍රය නිකුත් කළ දිනය හා එහි අනුක්‍රමික අංකය
4. සැපයුම කළ දිනය හා භාණ්ඩ හා සේවාවල විස්තර
5. සැපයුමේ ප්‍රමාණය
6. සැපයුමේ වටිනාකම, අයකළ බද්ද හා සැපයුම සඳහා වූ ප්‍රතිෂ්ඨාව
7. ඉන්වොයිසියේ හොඳින් පෙනෙන ස්ථානයක "බදු ඉන්වොයිසිය" යන වචන.

***(ලකුණු 03)***



aat SRI LANKA

b) 2019 අප්‍රේල් 30

*(ලකුණු 02)*

## තෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

| *06 පරිච්ඡේදය - රඳවා ගැනීමේ බදු සහ ප්‍රාග්ධන ලාභ බද්ද හා බදුකරණයට අදාල නඩු තීන්දු* |
|---|

රාජපක්ෂ එදි. දේශීය ආදායම් බදු කොමසාරිස් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය, තම නිවසේ නිල කාර්යාලය (ව්‍යාපාරික ස්ථානය) පවත්වාගෙන යන ලද අද්වකාද්වරයෙකු තම නිල කාර්යාලය සමන්විත නිවසේ සිට අධිකරණය වෙත යාමේ සහ ඒමේ වියදම්, බදු සඳහා අවසර දිය හැකි වියදමක් ලෙස තීරණය කරනු ලැබීය. එය එක් ව්‍යාපාරික ස්ථානයකින් තවත් ව්‍යාපාරික ස්ථානයකට යාමට සහ ඒමට ගිය වියදමක් බවත් නිවසේ සිට ව්‍යාපාරික ස්ථානයට යාමට සහ ඒමට ගිය වියදමක් නොවන බවටත් තීරණය කරන ලදී.

ඒ අනුව සොයිසාට තම නිවස සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සමාගම් රෙජිස්ටාර් වැනි දෙපාර්තමේන්තු දෙක අතර ගමන් කිරීමේ පිරිවැය ඉඩදෙන වියදම් ලෙෂ ඉල්ලා සිටිය හැකි අතර එය සොයිසාගේ ව්‍යාපාර ආදායමෙන් අඩු කර ගත හැකිය. මෙහිදී වාසස්ථානය ව්‍යාපාරික ස්ථානයක් ලෙස සැලකිය යුතුය.

*(ලකුණු 05)*

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

| **පරිච්ඡේදය 03 - වාසික පුද්ගලයන් සහ සමාගම් සඳහා බදුකරණය** |
|---|

1. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් වේ.
2. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් වේ.
3. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් වේ.
4. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් නොවේ.
5. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් නොවේ.

*(ලකුණු 05)*

| ***A කොටසෙහි අවසානය*** |
|---|

**B කොටස**

# පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

*05 පරිච්ඡේදය - බැදීම් හා ක්‍රියාපටිපාටි*

a) 2 වන කාර්තුව – 2018 නොවැම්බර් 15
3 වන කාර්තුව – 2019 පෙබරවාරි 15

***(ලකුණු 04)***

b)

තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බද්ද (වාරික ගෙවීම + රඳවාගත් බදු)

තක්සේරු වර්ෂය සඳහා ගෙවීමට ඇති ඉතිරි වාරික ගණන

| | |
|---|---|
| වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බද්ද | 900,000 |
| 2 වන කාර්තුව සඳහා ඇස්තමේන්තුගත වාරිකය | {900,000-(300,000+0)}/3 |
| | = **රු.200,000/-** |

***(ලකුණු 03)***

c)

1. අධිකරණ ක්‍රියාමාර්ග
2. බදු ගෙවන්නාගේ දේපළ තහනම් කිරීම සහ විකිණීම
3. තහනම් කළ දේපළ විකිණීම
4. ගෙවීම්වලින් හිලව් කරගැනීම
5. තෙවන පාර්ශ්ව ණයකරුවන්ගෙන් අය කරගැනීම

***(ලකුණු 03)***

# හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

*04 පරිච්ඡේදය - විවිධ ව්‍යවසායන් මත බදුකරණය*

**a. 2018/19 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාර ආදායම ගණනය කිරීම**

| | | රු |
|---|---|---|
| හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය | | = 3,230,000 |
| **එකතු කළා** | | |
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | (1,080,000+960,000)- ඉඩනොදේ | = 2,040,000 |
| ක්ෂය - ඉඩනොදේ | | = 240,000 |
| **අඩු කළා** | | |
| වත්කම් මත ප්‍රාග්ධන දීමනාව | | = (360,000) |
| බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම | | **= 5,150,000** |

***(ලකුණු 03)***

**b.** **හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද**

**හවුල් ව්‍යාපාර ආදායම මත 8%** = 5,150,000*8%

= **412,000**

***(ලකුණු 02)***

**c.** එක් එක් හවුල්කරුවන්ගේ හවුල් ව්‍යාපාර ආදායම් කොටස

| | **නාමල්** | **කමල්** | **එකතුව** |
|---|---|---|---|
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | 1,080,000 | 960,000 | 2,040,000 |
| ඉතිරි ලාභය | 1,555,000 | 1,555,000 | 3,110,000 |
| ලාභ කොටස | 2,635,000 | 2,515,000 | 5,150,000 |

***(ලකුණු 03)***

**d.** **එක් එක් හවුල්කරුට හිමි රඳවා ගැනීමේ බදු බැර කොටස,**

**නාමල්** = 2,635,000 * 8% = රු. 210,800/-

**කමල්** =2,515,000 * 8% = රු. 201,200/-

***(ලකුණු 02)***

**(මුළු ලකුණු 10)**

SRI LANKA

## *හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

*07 පරිච්ඡේදය වෙනත් ව්‍යාපාර බදු*

**(රු)**

| | | | | | |
|---|---|---|---|---|---|
| **නිමවුම් බද්ද** | | | | | |
| අපනයන | 6,120,000 | ශුන්‍ය අනුපාත | | | 0 |
| දේශීය විකුණුම් | 4,425,000 | 15% | | | 663,750 |
| යන්ත්‍ර විකුණුම් | 46,000 | 15% | | | 6,900 |
| | **10,591,000** | | | | **670,650** |
| **යෙදවුම් බද්ද** | | | | | |
| ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය මත | 116,000 | ශුන්‍ය අනුපාත මත සැපයුම් වලට ඉඩදෙන බද්ද | 116,000 | - | |
| කාර්යාල වියදම් මත | 38,000 | | 38,000 | | |
| නිෂ්පාදනයට භාවිතා කරන යන්ත්‍ර අළුත් වැඩියා මත | 4,800 | | 4,800 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මෝටර් රථ අළුත් වැඩියා මත | 3,000 | පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගන්නා බැවින් ඉඩ නොදේ | - | | |
| **ඉඩදිය හැකි යෙදවුම් බද්ද** | | | 158,800<br>26,000 | | |
| ඉදිරියට ගෙනා අතිරික්ත යෙදවුම් බද්ද | 26,000 | | 184,800 | | |
| | | | 157,785 | | |
| ශූන්‍ය අනුපාත මත සැපයුම්වලට අදාල යෙදවුම් බද්ධ | | | 27,015 | | |
| **ඉතිරි යෙදවුම් බද්ද ඉල්ලුම , නිමවුම් බද්දේ** 100% ට **සීමා වේ** | | | | | |
| **මුළු යෙදවුම් බද්ද** | | | | | (184,800) |
| **ගෙවිය යුතු** VAT **බද්ද**<br>අඩුකළා : වාරික ගෙවීම | | | | | 485,850<br>(250,000) |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | | | | **235,850** |

***(ලකුණු 10)***

***B කොටසෙහි අවසානය***

**C කොටස**

## *අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

*03 පරිච්ඡේදය - වාසික පුද්ගලයන් හා සමාගම් සඳහා බදුකරණය*

**හැෂ් ට්‍රේඩින් (පෞද්ගලික) සමාගම**
**2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගණනය**

| | | රු. |
|---|---|---|
| ව්‍යාපාර ආදායම (සටහන 1) | | 64,088,150 |
| ආයෝජන ආදායම ( සටහන 2) | | 600,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | | **64,688,150** |
| **අඩුකළා: සුදුසුකම් ලබන ගෙවීම් හා සහන** | | |
| අනුමත පුණ්‍යායතනයට කළ පරිත්‍යාග<br>බදු අය කළ හැකි ආදායමෙන් 1/5 හෝ රු. 500,000 යන දෙකෙන් අඩු ගණනට සීමා වේ | 1,000,000 | (500,000) |
| **බදු අය කළ හැකි ආදායම** | | 64,188,150 |
| බදු වගකීම @ 28% | | 17,972,682 |

| | | |
|---|---|---|
| **අඩුකළා : බදු බැර** | | |
| ආර්ථික සේවා බදු ගෙවීම ( 876,500 + 2,631,000) | | (3,507,500) |
| වාරික ගෙවීම | | (5,000,000) |
| කුලී ආදායම මත රඳවා ගැනීමේ බද්ද | | (60,000) |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | **9,405,182** |

**සටහන 1 - ව්‍යාපාර ආදායම ගණනය**

| | | | | + | - |
|---|---|---|---|---|---|
| | | | | රු. | රු. |
| බදු පෙර ලාභය | | | | 64,240,000 | |
| ආයෝජන ආදායම - කුලී ආදායම | | | | | 600,000 |
| ලී බඩු විකිණීමෙන් ලද ගිණුම්කරණ ලාභය | | | | | 80,000 |
| ලී බඩු විකිණීමෙන් ලද බදුකරණ ලාභය<br>විකුණුම් ප්‍රතිෂ්ඨාව<br>ලියාහළ අගය {235-(235*20%*2)} | =142,500<br>(141,000) | | | 1,500 | |
| ගිණුම්කරණ ක්ෂය | | | | 4,546,000 | |
| <u>ප්‍රාග්ධන දීමනා</u> | <u>අත්පත් කර ගත් වර්ෂය</u> | <u>පිරිවැය</u> | | | |
| ගොඩනැගිලි | 15/16 | 8,000,000 | 10% | | 800,000 |
| ලොරි | 16/17 | 4,324,000 | 20% | | 864,800 |
| මෝටර් රථය - ඉඩ නොදේ | 17/18 | 2,680,000 | | | |
| කාර්යාල උපකරණ | 18/19 | 1,235,000 | 20% | | 247,000 |
| පරිගණක | 17/18 | 2,875,000 | 25% | | 718,750 |
| ගෘහ භාණ්ඩ | 16/17 | 1,624,000 | 20% | | 324,800 |
| පරිගණක මෘදුකාංග | 18/19 | 1,000,000 | 25% | | 250,000 |
| | | | | | |
| පරිත්‍යාග | | | | 1,000,000 | |
| විදේශීය සංචාර – ඉඩ දේ | | | | - | |
| නීති වියදම් (ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්) | | | | 52,000 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | | | 1,432,000 | |
| සංග්‍රහ වියදම් | | | | 267,000 | |
| කපා හළ බොල් ණය – ඉඩ දේ | | | | - | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම | | | | 400,000 | |
| පාරිතෝෂික ගෙවීම | | | | | 765,000 |
| | | | | | |
| ගළපන ලද ලාභය | | | | **60,888,150** | |
| අඩු කළා : ඉ/ගෙ අලාභ 2017/18 | | | | (3,200,000) | |
| ව්‍යාපාර ආදායම | | | | 64,088,150 | |

**සටහන 2 – ආයෝජන ආදායම ගණනය**

| | | | |
|---|---|---|---|
| කුලී ආදායම | | 600,000 | |
| අඩු කළා : වියදම් | | | |
| නීති ගාස්තු | ඉඩ නොදේ | | 600,000 |
| ආයෝජන ආදායම | | | 600,000 |

***(ලකුණු 25)***

## *නවවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| |
|---|
| *03 පරිච්ඡේදය වාසික පුද්ගලයන් හා සමාගම් සඳහා බදුකරණය* |

**රුවන් මහතා**
**2018/19 තක්සේරු වර්ෂය සඳහා**
**ආදායම් බද්ද ගණනය**

| | | | | | |
|---|---|---|---|---|---|
| **සේවා නියුක්තික ආදායම** | | | | | |
| වැටුප ( 200,000*12) | | | | 2,400,000 | |
| ප්‍රවාහන පහසුකම්වල වටිනාකම | 30,000x12 | | | 360,000 | |
| ජීවිත රක්ෂණය | | | | 120,000 | |
| විනෝද ගමන | | | | 164,000 | |
| **සේවා නියුක්තික ආදායම** | | | | | **3,044,000** |
| ව්‍යාපාර ආදායම | | | | | |
| ශුද්ධ ලාභය | | | | 664,000 | |
| එකතු කළා: පරිත්‍යාග | | | | 250,000 | |
| ඡායා පිටපත් යන්ත්‍රය | | | | 65,000 | |
| අඩු කළා: ප්‍රාග්ධන දීමනාව | | 260,000 | ĵ¾I 5 | (52,000) | |
| **ව්‍යාපාර ආදායම** | | | | | **927,000** |
| **ආයෝජන ආදායම** | | | | | |
| **පොළී ආදායම** | | | | | |
| ස්ථාවර තැන්පතු | අවසාන රඳවා ගැනීමේ බද්ද | | | - | |
| භාණ්ඩාගාර බිල්පත් | | | | **126,000** | |
| **කුලී ආදායම** | | | | | |
| දළ ආදායම ( 45x12) | | | | 540,000 | |
| අඩු කළා : වරිපනම් බදු | | | | (84,000) | |
| **ආයෝජන වත්කම් උපලබ්ධි වීම** | | | | **456,000** | |
| ප්‍රතිෂ්ඨාව | | | 55,000,000 | | |
| **අඩු කළා:**පිරිවැය | | | (50,000,000) | | |
| තැරැව්කරු ගාස්තු | | | (100,000) | | |
| වැට | | | (825,000) | **4,075,000** | |
| **ආයෝජන ආදායම** | | | | | **4,657,0000** |
| **තක්සේරු ආදායම** | | | | | **8,628,000** |
| **අඩුකළා: සුදුසුකම් ලබන ගෙවීම් හා සහන** | | | | | |
| පුද්ගල සහන | | | | (500,000) | |
| සේවා නියුක්තික සහනය | | | | (700,000) | |
| දළ කුලී ආදායමෙන් 25% (540x25%) | | | | (135,000) | |

| | | | | | |
|---|---|---|---|---|---|
| රජයට කළ පරිත්‍යාග | ඉල්ලා සිටිය හැකි අගය | | 250,000 | (250,000) | |
| **බදු අය කළ හැකි ආදායම** | | | | | **7,043,000** |
| බදු වගකීම | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් පොළී | 126,000 | 5% | 6,300 | | |
| ප්‍රාග්ධන ලාභ | 4,075,000 | 10% | 407,500 | | |
| | 600,000 | 4% | 24,000 | | |
| | 600,000 | 8% | 48,000 | | |
| | 600,000 | 12% | 72,000 | | |
| | 600,000 | 16% | 96,000 | | |
| | 442,000 | 20% | 88,400 | | |
| | | | | | |
| | **7,043,000** | | **742,200** | | |
| අඩු කළා - බදු බැර | | | | | |
| කුලී ආදායම මත රඳවා ගැනීමේ බද්ද @ 10% | | | (54,000) | | |
| වාරික ගෙවීම් | | | (500,000) | | |
| **උපයන විට ගෙවීම්** | | | (192,440) | | |
| **වැඩිපුර ගෙවූ බද්ද** | | | | | **4,240** |

***(ලකුණු 25)***

***C කොටසෙහි අවසානය***

### *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2020 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*